FACULTY OF GRADUATE STUDIES
RECEIVED
27 MAY 2013
UNIVERSITY OF KELANIYA

# රජය හා ආගම අතර සම්බන්ධතාවය

(ක්‍රි. පූ. තෙවන සියවසේ සිට ක්‍රි. ව. තෙවන සියවස දක්වා)



| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 812 |
| වර්ග අංකය: | |



කේ. ඩී. ලක්මාලි ජයසේකර

**FGS / H / MSSC / 2007 / 01**

සමාජීය විද්‍යාපති පාඨමාලාව - ඉතිහාසය

කැලණිය විශ්ව විද්‍යාලය

## නිබන්ධන සාරාංශය

දේවානම්පියතිස්ස රාජ්‍ය අවධිය ලංකා ඉතිහාසයේ සංධිස්ථානයකි. මහින්දාගමනයත් සමගම මෙරටට ලැබුණු බෞද්ධාගම සංවිධානාත්මක ආගමක් වූවා සේම එමගින් මෙරට දේශපාලන, සංස්කෘතික හා ආර්ථික අංශයන්හි කලින් නොවූ විරූ දියුණුවක් ඇතිකරනු ලැබිණි. රජතුමා විසින් බුදුදහම වැළඳගත් නිසා ජනතාවද බුදු දහම වැළඳගත් අතර එය රාජ්‍යාගම බවට පත් විය. අරිට්ඨ ඇමති මහණ කරවීමත් සමග ලක්දිව භික්ෂු ශාසනය ඇති වූ අතර එය ඉතා සීඝ්‍රයෙන් පැතිර ගියේය. භික්ෂූන්ගේ වර්ධනයත් සමග ආහාර හා වාසස්ථාන පිළිබඳ ගැටළු මතු වන්නට නොදී රජු සියලු භික්ෂූන් විෂයෙහි සිව්පසයෙන් සංග්‍රහ කල අතර වෙහෙර විහාර ද සාදවා දී තිබේ. මෙහි මුල් පරිච්ඡේදයෙන් විස්තර වන්නේ භික්ෂූණ් සඳහා පාලකයන් විසින් ඉටුකරන ලද සේවාව පිළිබඳවයි. ඒ අනුව රජවරුන් විසින් භික්ෂූන්ට සිවුරු පිරිකර පූජා කල අයුරුත්, සිව්පසයෙන් දැක්වූ දායකත්වයත්, වෙහෙර විහාර නඩත්තු කිරීමට සහය දුන් අයුරුත්, නව වෙහෙර විහාර ඉදි කරමින් ශාසනාභිවර්ධනයට උරදුන් අයුරුත් උදාහරණ සහිතව විස්තර කර තිබේ.

රජවරුන් විසින් මෙවන් වූ උත්තරීතර සේවාවන් ඉටුකරනු ලබන විට භික්ෂූන් විසින් රජවරුන්ටද ඊටත් වඩා නොදෙවෙනි වූ සේවාවක් ඉටුකොට තිබේ. දේශපාලන ක්ෂේත්‍රයේ උපදේශකයන් හා අනුශාසකවරුන් ලෙසින් ක්‍රියා කිරීමෙන්, පාලක පන්තියේ ආරක්ෂකයින් ලෙස කටයුතු කිරීමෙන් භික්ෂූන් දේශපාලනයට දැක්වූ දායකත්වය දෙවැනි පරිච්ඡේදයෙන් විස්තර කරයි.

භික්ෂූන් හා රජවරුන් අතර පැවති අන්‍යෝන්‍ය සම්බන්ධතාව රාජ්‍යයේත්, ශාසනයේත් වර්ධනයට එකලෙස බලපෑ බව කිව හැකිය. ඇතැම් අවස්ථාවල ශාසනය ආරක්ෂා කර ගැනීම සඳහා රජවරුන් විසින් දුසිල්වත් භික්ෂූණ් රටින් නෙරපන ලද අවස්ථා ද තිබේ. එමෙන්ම රාජ්‍යය ආරක්ෂා කර ගැනීම සඳහා භික්ෂූන් විසින් අධාර්මික රජවරුන් පත් වූ අවස්ථාවල ඊට එරෙහිව කටයුතු කර තිබේ. මේ බව තෙවැනි පරිච්ඡේදයෙන් විස්තර කරයි.

සිව්වැනි පරිච්ඡේදයෙන් රාජ්‍යයකින් අපේක්ෂා කරනු ලබන කාර්යභාරය විස්තර කරයි. ඒ අනුව ජනතාවගේ කටයුතු ක්‍රමවත්ව හා විධිමත්ව ඉටු කිරීමත්, නීතිය හා යුක්තිය සාධාරණව පවත්වාගෙන යාමත්, රජවරුන්ගේ වගකීම වූ අතර මේ වෙනුවෙන් රජවරුන් දැක්වූ දායකත්වය කෙසේද යන්න විස්තර වේ.

පස්වැනි පරිච්ඡේදයෙන් දේශපාලන සංවිධානය හා ආගම අතර පැවති සම්බන්ධතා කවරේ ද යන්නත් දේශපාලන සංවිධානය තුළ සංකල්පමය වෙනසක් ඇති කිරීම සඳහා කිනම් දායකත්වයක් ආගමෙන් ලබා දී තිබේ ද යන්නත් විමසීමට ලක් කරයි.

බුදුරජාණන් වහන්සේ විසින් රජකු සතු විය යුතු ගුණාංග පිළිබඳව දේශනා කර තිබේ. ඒ අනුව දසරාජ ධර්මය, සප්ත අපරිහානිය ධර්ම, සතර සංග්‍රහ වස්තු යන පිළිවෙත් අනුව රටක් පාලනය කිරීමේ වැදගත්කම අවබෝධ කරගත හැකියි. එම සංකල්ප අනුව පාලන කාර්යය පවත්වාගෙන යාම සඳහා අපේ රජවරුන් ගත් උත්සාහය පිළිබඳව සවැනි පරිච්ඡේදයෙන් විස්තර වේ.

ආගමික පසුබිමක් මත රටක පාලනය ක්‍රියාත්මක වන විට ඒ තුළින් වන සංස්කෘතික හා සමාජීය තත්වය පිළිබඳව සත්වැනි පරිච්ඡේදයෙන් සමාලෝචනය කර දක්වා තිබේ.

ක්‍රි. පූ. තෙවැනි සියවසත් ක්‍රි. ව. තෙවැනි සියවසත් අතර කාල පරිච්ඡේදය පිළිබඳ අධ්‍යයනය කිරීමේ ලා ක්‍රි. පූ. තෙවැනි සියවසෙන් පසු ලියන ලද අභිලේඛන වැදගත් වේ. සංස්කෘතිකාංග වල ප්‍රදේශීය ව්‍යාප්තිය හා කාලීන ව්‍යාප්තිය පිළිබඳව නිවැරදි තොරතුරු ලබා ගැනීමේදී පුරා විද්‍යාත්මක ස්මාරක හා නටඹුන් තුළින් ලැබෙන සහය ද මහත් ය.

මහා වංසයට ලියන ලද ටීකා ග්‍රන්ථයක් වන වංසත්ථප්පකාසිනිය, මහවංසය, මෙන්ම අදාල කරුණු ලබා ගැනීම සඳහා බොහෝ උපකාරී වෙයි. මහාවංසයේ අන්තර්ගත ශාසනික හා දේශපාලන තොරතුරු වඩා විශ්වාසනීයත්වයකින් හැදෑරීමටත් මහාවංස කතුවරයාගෙන් ගිලිහී ගිය ඇතැම් කරුණු පිළිබඳ අධ්‍යයනයටත් වංසත්ථප්පකාසිනිය ප්‍රයෝජනවත් වේ. මීට අමතරව ධාතු වංසය, පාලි බෝධි වංසය, ථූපවංසය, සමන්තපාසාදිකාව, සුමංගල විලාසිනි, පපඤ්චසූදනි, මනෝරථපූරනි, සම්මෝහවිනෝදනී, සහස්සවත්ථු ප්පකරණය, සීහළවත්ථුප්පකරණය, රසවාහිනිය,වැනි ග්‍රන්ථ ද වෛදික සාහිත්‍ය, සංගම් සාහිත්‍ය, අර්ථ ශාස්ත්‍රය, දිව්‍යාවදානය වැනි ග්‍රන්ථ ද තොරතුරු ලබාගත හැකි මූලාශ්‍ර අතර වේ.

මෙම අධ්‍යයනය සඳහා උපයෝගී කර ගැනෙන ප්‍රාථමික මෙන්ම ද්විතීය මූලාශ්‍ර වල ඇතැම් විට පක්ෂග්‍රාහී අදහස් ඉස්මතු වන මුත් සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක සාක්ෂි සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීමෙන් සත්‍ය කරුණු ඉස්මතු කර ගැනීමට ඉඩක් ලැබෙන අතර නව නිගමනයන් කරා එළඹීමටත් මධ්‍යස්ථ පර්යේෂණ කාර්යයන්හි නිරත වීමටත් හැකියාවක් ලැබේ.